# කරුණු පහකින් යුතු මහණ නිරයට යන්නේ වෙයි

## දුතියඅවණ්ණාරහ සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 430 - 433)

කරුණු පහකින් යුක්ත ආවාසික භික්ෂුව ගෙනවිත් තබන ලද බරක් බහා තබන ලද්දේ යම් සේ ද එසේ ම නිරයෙහි උපදියි.

1. නොදැන, නොසොයා, අගුණ කිය යුත්තාගේ ගුණ කියයි.
2. නොදැන, නොසොයා, ගුණ කිය යුත්තාගේ අගුණ කියයි.
3. ආවාස කෙරෙහි මසුරු වූයේ, ආවාසයේ බලවත් ගිජුකම ඇත්තේ වෙයි.
4. දායක පවුල් කෙරෙහි මසුරු වූයේ, කුලයන් කෙරෙහි ගිජු වූයේ වෙයි.
5. ශ්‍රද්ධාවෙන් පූජා කළ දේ අයෝග්‍ය සේ යොදන්නේ වෙයි.